# SRI LANKA EXPORT DEVELOPMENT BOARD

## ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

## இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

**කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)**

# ලංසු සඳහා ආරාධනයයි

## මෙහෙයුම් කල්බදු පදනම මත මෝටර් රථ පහක් (05) ප්‍රසම්පාදනය

## කොන්ත්‍රාත් අංකය: EDB/PU/NCB/2026/09

1. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) වෙනුවෙන්, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින් මෙහෙයුම් කල්බදු පදනම මත ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය වෙත මෝටර් රථ පහක් (05) ලබා ගැනීම සඳහා යෝග්‍යතා පූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

   - **සෙඩාන් (**Sedan**) හෝ** SUV **රථ**

2. 2024 ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල සඳහන් කර ඇති ජාතික තරගකාරී ලංසු තැබීමේ (NCB – තනි අදියර තනි කවරයේ ලංසු තැබීමේ ක්‍රමවේදය) පටිපාටියට අනුකූලව ලංසු තැබීම සිදු කරනු ලබන අතර, මාර්ගෝපදේශවල අර්ථ දක්වා ඇති පරිදි සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා මෙය විවෘත වේ. කොන්ත්‍රාත් කාලය මාස 36 කි.

3. කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා සුදුසුකම් ලැබීමට, ලංසු ඉදිරිපත් කරන අවස්ථාව වන විට සාර්ථක ලංසුකරු කිසිදු රජයේ ආයතනයක් හෝ පිළිගත් නියාමන බලධාරියෙකු විසින් අසාධු ලේඛනගත කළ, අත්හිටුවන ලද හෝ තහනම් කරන ලද අයෙකු නොවිය යුතුය.

4. සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා වන සුදුසුකම් නිර්ණායක පහත සඳහන් කරුණු වලින් සමන්විත විය යුතුය (අතිරේක සුදුසුකම් අවශ්‍යතා ප්‍රසම්පාදන ලේඛනවල දක්වා ඇත):

   - ලංසුකරු ශ්‍රී ලංකාවේ අදාළ නීති හා රෙගුලාසිවලට අනුකූලව නීත්‍යානුකූලව ලියාපදිංචි වූ සමාගමක් විය යුතුය.
   - ලබා දෙන අවස්ථාව වන විට ධාවනය කර ඇති කිලෝමීටර ප්‍රමාණය 150,000 ට අඩු වාහන ලංසුකරු විසින් සැපයිය යුතුය. වාහන නිෂ්පාදිත වර්ෂය 2023 හෝ ඊට පසුව විය යුතුය.
   - පසුගිය වසර තුන (03) ඇතුළත මෙහෙයුම් කල්බදු පදනම යටතේ සේවා සපයා ඇති බවට වන ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

5. උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදන ලේඛන 2026 නොවැම්බර් 18 වන දින දක්වා වැඩ කරන දිනවල 09.00පැය සිට 15.00පැය දක්වා කොළඹ 02, නවම් මාවත, නො. 42,NDB-EDB කුලුන, 06 වන මහල, සහකාර අධ්‍යක්ෂ – ප්‍රසම්පාදන කාර්යාලයෙන් පරීක්ෂා කළ හැක. EDB නිල වෙබ් අඩවියේ (www.srilankabusiness.com/announcements/) "Announcements" කොටස යටතේ ප්‍රකාශයට පත් කර ඇති ප්‍රසම්පාදන ලේඛනයට පිවිසීමෙන්ද ප්‍රසම්පාදන ලේඛන පරීක්ෂා කළ හැක.

6. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට වැඩිදුර තොරතුරු කොළඹ 02, නවම් මාවත, නො. 42, NDB-EDB කුලුන, 06වන මහල, සහකාර අධ්‍යක්ෂ – ප්‍රසම්පාදන වෙතින් වැඩ කරන දිනවල 09.00පැය සිට 15.00පැය දක්වා ලබා ගත හැක. දුරකථන: 011-2300702, විද්‍යුත් තැපෑල: disna@edb.gov.lk.

7. අදාළ ආපසු නොගෙවන ගාස්තුව රු. 3,500.00 ක් ගෙවීමෙන් 6 වන ඡේදයේ සඳහන් ලිපිනයෙන් ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයෙන් (EDB),උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට ඉංග්‍රීසි භාෂාවෙන් වූ ප්‍රසම්පාදන ලේඛන සම්පූර්ණ කට්ටලයක් ලබා ගත හැක. ගෙවීම් මුදලින් පමණක් සිදු කළ යුතුය. මුල් ගෙවීම් ලදුපත ලංසුව සමග අමුණා තිබිය යුතුය. අවශ්‍ය ගෙවීම් සතාට කිරීම් නොමැතිව ඉදිරිපත් කරන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයේ සිට දින හැත්තෑහතක (77) කාලයක් සඳහා ලංසු වලංගුව පැවතිය යුතුය.

9. ලංසු මුල් පිටපත මුද්‍රා තැබූ කවරයක බහා තිබිය යුතුය. කවරයේ වම්පස ඉහළ කෙළවරේ "EDB/PU/NCB/2026/09 – **මෙහෙයුම් කල්බදු පදනම මත මෝටර් රථ පහක් ලබා ගැනීම**" ලෙස පැහැදිලිව සටහන් කළ යුතුය.

10. මුද්‍රා තැබූ ලංසු 2026 නොවැම්බර් 19 වන දින ප.ව. 02.30 ට හෝ ඊට පෙර සභාපති, ප්‍රසම්පාදන කමිටුව, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය,06වන මහල, NDB-EDB කුලුන, නො. 42, නවම් මාවත, කොළඹ 02 යන ලිපිනයට ගෙනවිත් භාර දිය යුතුය, නැතහොත් ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතුය. සියලුම ලංසු සඳහා ප්‍රසම්පාදන ලේඛනයේ දක්වා ඇති ආකෘතියට අනුව ශ්‍රී ලංකා රුපියල් එක් ලක්ෂ තිස්දහසක (රු. 130,000.00) වටිනාකමකින් යුත් බැංකු ඇපකරයක් ආකාරයෙන් ලංසු ඇපකරයක් ඉදිරිපත් කළ යුතුය.

11. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. සහභාගී වීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන්, එදිනම ප.ව. 02.45 ට 7 වන මහලේ පිහිටි කුඩා සම්මන්ත්‍රණ ශාලාවේදී ලංසු විවෘත කරනු ලැබේ.

12. පූර්ව ලංසු රැස්වීමක් 2026 නොවැම්බර් 12 වන දින පෙ.ව. 10.00 ට EDB හි 9 වන මහලේ අධ්‍යක්ෂ මණ්ඩල ශාලාවේදී පැවැත්වේ. උනන්දුවක් දක්වන සියලුම ලංසුකරුවන්ට පූර්ව ලංසු රැස්වීමට සහභාගී විය හැක.

**සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,**
**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (**EDB**),**
**නො. 42, නවම් මාවත,**
**කොළඹ 02.**
**2026 නොවැම්බර් 06**